# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2312/42 – 2022 දෙසැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා – 2022.12.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, දළුවෙල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/YTT/2020/479 හා 2020.12.14 වන දිනැති පූගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' - එගොඩහවත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0140 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ එච්. ජී. සීලවතී හිමිකම් කියන එගොඩහවත්ත; දකුණට: එච්. ජී. සීලවතී හිමිකම් කියන එගොඩහවත්ත; බටහිරට: එච්. ජී. සීලවතී හිමිකම් කියන එගොඩහවත්ත සහ පී. ජී. නිහාල් කුමාරසිංහ හිමිකම් කියන එගොඩහවත්ත .

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/24/2020/HA/135.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0398

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකන්ද (250), ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටකන්ද - කොට්ඨාස අංක 7, වට්ටාරන්තැන්න (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/ MHN/2019/108 හා 2019.10.23 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.**– කුන්ඩසාලේ -හාරගම ජලසම්පාදන ව්‍යාපෘතිය යටතේ පිරිපහදු නල එලීමට යෝජිත ප්‍රවේශ මාර්ගයේ පරවශතා අයිතිය අත්කර ගැනීම.

**01. කැබලි අක්ෂර ‘ඒ’ - ප්‍රමාණයː හෙක්. 0.0066 ක් පමණ**

උතුරට: අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරාධිපති සහ තවත් අය හිමිකම් කියන වැලිපැල කුඹුරවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරාධිපති සහ තවත් අය හිමිකම් කියන වැලිපැල කුඹුරවත්ත; දකුණට: සිමෙන්ති කාණුව සහ අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරාධිපති සහ තවත් අය හිමිකම් කියන වැලිපැල කුඹුරවත්ත; බටහිරට: අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරාධිපති සහ තවත් අය හිමිකම් කියන වැලිපැල කඹුර වත්ත.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/WS/171.
2022 නොවැම්බර් මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.